# නිර්මාණ Nirmana

## සිහියට නැගෙන බක්මහ

සිටියත් අගනුවර මහ රැජිණගෙ දේසේ
කොවුලා නැතත් එනවා මතකය පෙරසේ
කැමට නැතත් සිහියට එනවා රසසේ
සුවඳයි බැදෙන කැවුමක අවුරුදු සමයේ

සීතල සමයෙ දළු මල් කොළ හලා හැම
ඉදල් කූරු මෙන් ගස් අතු පෙනෙයි හැම
ඉඳහිට පුළුන් කැටිසේ වැටෙන විට හිම
සුවයයි මැවුනෙ පිණි කැටයක අපේ බිම

කැවුම් කොකිස් කජු අළුවා හැම ගෙදර
කිරිබත් සමග මුං අළුවා පිසෙන වර
කහ පැහැ ගැහුණු රඹකැන්වල දැනෙයි බර
කන වැටුණා රබන් හඩ නගනා මිහිර

මී අඹ ගසේ කොවුලා ගී ගයන හැටී
වෙල ළඟ කජුගහේ ඔන්චිලි පදින හැටී
එරබදු මල් පිපී ඈතට පෙනෙන හැටී
සුවඳක් එනු වගෙයි නාමල් රේණු ගැටී

නැකතට වෙලාවට කිරිබත් බුදින් නෙද
බුලත් අත් පුදා දොස් දුරු කරන් නෙද
හිසතෙල් ගාන නැකතට පෙල ගැසෙන් නෙද
නොනගතයට පිරිස පන්සිල් නොයන් නෙද

රං රඹුටන් ගහ ද වළි කුකුලන් ගැනද
තුංතුඹ මෙන්ම දොඹමල් තුට්ටු දෙකටද
රංඩු කරන හන්දා මාමා ගැනද
දොං තරිකිට රබන් පද රැව්දේ නිබඳ

*රාජකීය පණ්ඩිත ශාස්ත්‍රපති*
♦ ***පූජ්‍ය පන්නල සුමේධ ස්ථවිර***
**Thames Viharaya**, Croydon **UK**

## සුරකිමු මව්බිම

වැජඹෙන්නට නොගොස් පිහිනුම් වැවක නනා
නිජ බිම හදන්නට සැලසුම් ඇතිව මනා
වි ජයග්‍රාහි විලසට සිහ කොඩිය වනා
ර ජවිය මිහිඳු නරනිඳු මුළු රටම දිනා

දොර දොර නිදහසේ අමයුරු සැපේය
පෙ ර මහ එළිය වී ජයමහ කැපේය
හ ර සර ලක් මවට හද මල පිපේය
ඉ ර හඳ තිබෙන තුරු මේ රට අපේය

සැ ක බිය අද නොමැත ජාතිය බල ගතුය
එ ක මවකගේ දරුවන් ලෙස එක මුතුය
දු ක සැප කියන බුදු දහමද අප සතුය
නෙක දොස් නොපා නිදහස රැක ගත යුතුය

කොයි අත ගියත් කනපිට නොවේ හොඳ පිටක්
ව යි රෙන් නොමැත ජාතින් අතර අස තුටක්
ඇ යි නොපෙනෙන්නෙ ඇතිබව හැමෝටම හෙටක්
අ යි තිය කියන්නට කෝ අපට වෙන රටක්

ආගම් අතර සුහදත්වය පළුදු නොවී
සාමෙන් පුරෝගාමීව සිට එකතු වෙවී
ලෝකෙන් උතුම් රට සේ ආදරය කැවී
සාඩම්බරෙන් රටටම දිය යුතුය සවී

ඇ ති නැති හැමෝටම දියුණුවකට යන්ට
නැති ලෙස ගැටළුවක් සිප්සත ලැබ ගන්ට
පැ තිකඩවල් හදා අගහිඟ නොති බෙන්ට
අ ති උත්තමය මග හැදුවොත් දරු වන්ට

පැ තු ම් බරව ගහ ඇල දොල ඇදේවා
පු ර න් කුඹුරු මැද කිරිබත ඉදේවා
ගහෙන් ගහට කොස් දෙල් අඹ හැදේවා
ගමෙන් ගමට සමගියෙ අත් බැදේවා

ය ට කොට අසමගිය මව්බිම රැකී මෙන්
කට බඩ බත බුලත ගැන නොසලකා මෙන්
ව ට පිට නොපැන බහිරවයයි යකා මෙන්
ර ට ගොඩ නගන්නට නැගිටිමු එකා මෙන්

♦ ***කිවිපති පාතකඩ කුලතිලක***
මහරගම **Sri Lanka**

## යළි හමුවෙමු

විසි අවුරුද්දක් නොදැක හිටිය නුඹ
මෙන්න ඇවිත් හුළඟක් වාගේ
පෙර ඇදිනුම්කම් යළි මතුවන්නේ
ඉහේ මලක් පිපුණා වාගේ

කාගෙ පවට ඉහ නිකට පැහුණිදෝ
කාට කියන්නද මේ නඩුවා
ජාතිය ආගම උන්නේ හරහට
මගෙ හිත වාවන්නේ නැතුවා

නාඹර වයසෙදි හැංගි හැංගි අපි
මුලිච්චි වුණු මේ කොළොම්තොටේ
හැන්දෑ වරුවක ළඟින් වාඩිවී
බලා ඉඳිමු අපි ඉර සේවේ

♦ ***ශ්‍රියා කුමාරසිංහ*** **New Zealand**



## අම්මා නිසයි අවුරුදු

ගේ දොර අළුත් විය ලියලන විටදි හැඟුම්
ගොම මැටි ගෑ බිමේ මතුවුණි ගතිය නැවුම්
ඇඳ පුටු දොර ජනෙල් අන්දා අළුත් ඇඳුම්
කුස්සියෙ ලිපාටය අම්මා කළේ වැඳුම්

නැති බැරිකම කොතෙක් තිබුණත් අත ඉතිරී
කැටයක් කාසි බිඳුණා හඩ දී මිහිරී
අම්මා ඉබේ පොහොසත් වී හිත දහිරී
අවුරුදු ඇඳුම් ලැබුණා කාටත් සුපිරී

කිරිබත ඉදී කිරි උතුරා ගලන විට
කිරි ඉතිරෙන්න පැතුවේ අම්මාය ගෙට
සිරිබර නැකත අවුරුදු කියා අප හට
අම්මා නිසයි ලැබුණේ කාලයක සිට

♦ ***ඇල්බට් ඇම්. ලියනගේ***
කැන්දලියද්දපාළුව **Sri Lanka**

## අත්තම්මාගෙන් දරුවන් වෙතටයි !

ලන්ඩන් වලට අද උදයේ පිනි වැටුණා
මීදුම ගලාවිත් මුළු පෙදෙසම වැසුණා
හිරු දෙවි හැඩට මතුවී යළි යට ගිලුණා
ලන්ඩනයට වසන්තය ආ බව දැනුණා

සිහිවෙයි හැම විටම නෑදෑ සියළු දෙනා
ලන්ඩන්වල ඉඳන් මම වෙන්නෙමිය සිනා
දරු මුනුබුරන් ආලෝකය පැලට ගෙනා
ඔබලා නිසා මගෙ දිවියම එළිය වුණා

දැන් නිල් අහස හිරු එළියෙන් එළිය වෙලා
හිරු දෙව්රද මැකී පාවුණ අඳුරු වළා
යුද බිය නිවී දැන් ඒ බිය තුරන් වෙලා
උතුරද දකුණ සිහ කොඩියෙන් ලෙළ දීලා

සඳ හිනැහුනත් ලන්ඩන් තුරු වදුළු මත
බොල් පිණි වැටී පරිසරයම වීය තෙත
දුරුරට සිටින ඔබලගෙ අත්තම්ම වෙත
ලියුමක් ලියන්නට අමතක නොවන් පුත

අඩුපාඩුව මකන්නට මා නොමැති තැන
ඔබලා ළඟ තිබේ ඉහළම මිනිස් ගුණ
ඉදිරිය බලා නිති කටයුතු කරනු මැන
මම සිහි කරමි ඔබ සැමදා උදෑ සන

♦ ***රත්නාවලී කුමාරි දිසානායක***
**Hounslow Middx UK**

## අවුරුදු උදාව

රඹකැන් රස කැවිලි මේසය උඩ ඇත් තේ
මුලුතැන් ගෙයි පිසෙයි කිරිබත් ලිප මත් තේ
අලුතෙන් ගෙනා රෙදිපිළි කොතැනද නැත් තේ
අද තුන් හෙළේ මංගල්‍යකි හැම පැත් තේ

සිරි තට කෙරෙන වැඩ ජාතියටම පොදු ය
හරි යට නැකත ගරුකෙරුමට සුපුරුදු ය
කිරි බත වගේ හැම සිතුවිලි පිරිසිදු ය
සිරි ලක පුරා අද සිංහල අවුරුදු ය

♦ ***වෑවල වීරසිංහ*** *හොරණ Sri Lanka*

## බක් මහ අසිරි

දැඩි ගිම් සනසවා ගත සිත දෙක නිවන
ගොරවන ගොඩ වැස්ස හැන්දෑවට වැටෙන
බක් මහ උළෙල ළඟ ළඟ එන බව කියන
ගස් වැල් සරු කරයි කොළ මල් පල පිරෙන

එරබදු මල් පිපෙයි වැට දිග හතර වටේ
මල්වල තද රතට මුළු ගම එළිය වැටේ
මී අඹ මිහිර වඩවයි කොවුලනගෙ කටේ
එමියුරු හ'ට ගහකොළ මඳ පවනෙ නැටේ

දිය රැළි සිඹ හමන මඳ නල ගත සිතට
සිහිලක සුවය ගෙනදෙයි ගිම් දැඩි කලට
පලවැල ඉදී පැණි බරවී දැඩි ගිමට
මගුල් මේස ඇතිරෙයි හැම තැන අපට

බක් මහ පැමිණෙන්න පර එන මැදින් මහේ
මහ-දින් මහා අස්වැන්න ද සරුව පැහේ
අටු කොටු පිරෙයි ඒ අස්වනුවලින් රැහේ
මල් පිපුනා වගෙයි හැම ගෙවි ලියගෙ ඉහේ

රොන් බර මලින් ගහ කොළ අතු රිකිලි පිරී
බමරුන් රහයි ගෙන දී රඟහලක සිරී
වන තුරු සෙවනෙ මී වද පැණි කැරලි කෙරී
පැතිරේ වසත් සිරි මහුලක් බවට හැරී

සෙබා දහමෙ සැඟ වී පවතින බලය
පිබිදී සොඳුරු කරමින් සිරි ලක් තලය
මංගල සිරි ගන්නෙ බක් මහ ආ කලය
විසිතුරු වසත් සමයට ඒ මස මූලය

♦ ***මහාචාර්ය ටී. එස්. අබේවික්‍රම***
**Harrow UK**

## නුඹ කොහෙද?

සිදාදියේ රැකියාවක් ලැබුණා කළඑළි බහින් න
දිග කලිසම් කමිස ඇඳන් සුබ නැකතින් පිටත් වෙන් න
නෙත් දහසක් තිබුණත් මිදි ඔබෙ හැඩ රුව බලාගන් න
හිටි හැටියෙම මගෙ දෙයියෝ මහත්තෙයෙක් වුණා ඔන්න!

එදා ඉඳන් මම තනිවී තනියට තනි රකින වා
ඇහැ පියවෙන තුන් යාමෙට බීත හීන පෙනෙන වා
රටා දමා වියූ පැදුරෙ මල් ලියකම් තැවෙන වා
හිතට හොරෙන් අතැහිලි තුඩු නුඹ කොහේද හොයන වා

කෝඩුකාරකම හින්දා සෙයිලමෙ තනිවුණා වත්ද
ඇහැ පිනවන නේක දසුන් හිත වල්මත් කළා වත්ද
සැන් පවුඩර් සුවඳ දිගේ පියවර එසවුණා වත්ද
මගෙ රන්කඳ සිදාදියේ උගුලක පැටලුනා වත්ද

මහ මන්දිර තට්ටු ගෙවල් කඩ සල්පිල් අතර ජයට
දූවිලි මල් වරුසාවකි මුතු කුඩයක් නොමැත හිසට
සිහින ලොවක් ජයගන්නට අභිනික්මන් කරපු ඔබට
මගතොට ගැන නිනව්වකින් පාර මතක නැද්ද ගමට

සාර සුබාවට හැදුනත් හේනේ පලදාව යසට
ගමේ ඇත්තො හෙලන බැලුම් දුක් සංකා ගෙනෙයි හිතට
අමාවකේ අහස් ගැබේ සැඟවුණු චන්ද්‍රයා ලෙසට
වහන් නොවී ගම ආවොත් කැලෑ දෙයියො බලයි නුඹට

♦ ***පද්මා කුරුප්පු*** **Paris France**

## Tortoises

As the children playing on the shores of
Colombo's Beira Lake
Much more in fun than with malice,
We threw stones at tortoises.
Half - submerged like submarines they point
their heads,
Like periscopes above the water.

Calm, unhurried since primordial times,
To observe these amphibious reptiles
In our speed-obsessed age, is revealing.

♦ **Denis Janz - London NW8**



## බාල වියට ඉගිලෙමී

බාල වියට සඳ බිලි දමා
මතක එක දෙකක් ඇද ගමී
මතක සිහිනයක බැඳ දමා
මිහිරි ලෝකයක තනිවෙමී
සිතැඟි මතක රැක දැල් දමා
අනිසි අතීතය මකවමී
නැවත සිහිනයක සැතපිලා
බාල වියට මගෙ ඉගිලෙමී

භව සාගරේ ඉදිකටු වැනී
අපගේ කුසල් අගයක් නැතී
ඉදිකටු මලෙන් රිංගා ගොසින්
සගමොක් සුවේ ලබනු බැරී

කළ සැම දේ සතුටක් වුණී
පිරිසිදු සිතේ හිංසා නැතී
අසරණ වූවන් වනසන සිතින්
මතයක නැගී වැජඹෙනු බැරී

♦ **Dr *වික්‍රමප්‍රිය පෙරේරා***
**USA**

## හෙළ අවුරුදු

ඇසී කොවුල් ගී නාදය
ඉදේ ගහේ කජු පුහුලන්
රැයේ ඉඳන් තුරු මුදුනේ
පෙරළි කරති මා වවුලන්
මේ පලබර කාලේ
හෙළ අවුරුදු කාලේ
ගොයම් පැසී බැත පාගා
අටුව පුරා වී අතුරා
ඉදෙන අඹද පැණිවරකා
දසුන සිතට සුව එළවයි
නැකතට කිරිබත සදා
දෙගුරුන් පා නැමදලා
පැරණි සිරිත් රකිමිනා
අවුරුදු දින ළඟ එනා
මේ පලබර කාලේ
හෙළ අවුරුදු කාලේ

♦ ***මංගලිකා ගමගේ***
**Sri Lanka**

## ගමරට අවුරුදු

ගහ කොළ අතු අග මල් පුදින වා
සුවඳ හමාගෙන සුළං හමන වා
සමනළ මැසි රංචු පිරෙන වා
අපගේ අවුරුදු කාලෙ ලබන වා

නිදහස් නිවහල් රටක් අපට ඇත
ඒ රට වෙනවා ඇත දැන් සරු කෙත
රට දියුණට හෙලනා දහදිය මත
සපිරේවා! කොයි කාගෙත් හොඳ හිත

අවුරුද්දට අඹ අත්තක එල්ලා
පදින්න තරගෙට රන් ඔන් චිල්ලා
කැවුම් කොකිස් ඉදෙනා ඉව අල්ලා
අළුත් ඇඳුම් පැළඳුම් ඇඳ පල්ලා

නැකතට කිරිබත් පිසගෙන කන් නට
බුලත් අතක් දී හොඳ හිත ගන් නට
ඉතිහාසය යළි මතකෙට ගන් නට
වරෙන් වරෙන් අවුරුදු ගම්මා නෙට!

♦ ***ප්‍රේමා එස් රූපසිංහ***
නුගේගොඩ **Sri Lanka**

## මගේ අවුරුදු ලෝකය

ඉලත්තට්ටුව පිරී බුලතින්
පුවක් හුණු දුම්කොළත් සමගින්
මකුලුවන් නෑ දැල් බඳින්නේ
ගෙවල් පිරිසිදු කර තිබෙන්නේ

රතිඤ්ඤා සහ රබානේ හඬ
ගම පුරා හැම තැන ඇහෙන්නේ
කෙසෙල් ඉදිලා කැවුම් පිසිලා
සාලෙ මැද මේසේ තියෙන්නේ

අලුත් අවුරුදු නැකත පිළිපැද
ගුරු දෙගුරු හැම නැමදලා
හිසට තෙල් ගෑවේ පියාණන්
ආයුබෝ වේ! පැතුම් පතලා

ළඟපාත කොයි කාට කාටත්
පිඟන් පුරවා කෑම යැවුණේ
පාසැලේ පොතපතට අතදී
එක පසෙක ගුරුසෙවණේ රැඳුණේ

ළිඳත් අපගේ පරම සම්පත
අම්මගෙනි එය අලෙවි කෙරුණේ
උන්චිල්ලා පදින තරමට
ළඳුන් වාරම් පෙළගැසෙන්නේ

තවම මගෙ සුන්දර ලොවයි එය
එයට මා යළි රැගෙන යන්නේ
ඒත් අපගේ දරු පැටව් නැත
එවන් සුන්දරකම දකින්නේ

♦ ***අමර ගුණසේකර***
Parice **France**

## අවුරුදු සුබ සිහිනේ

දළදා හිමි රැකවරණා
බත බුලතින් සාරවෙලා
පුරසඳ පායන විලසේ
නව අවුරුදු උදාවෙලා

නාමල් අතු අග පිපිලා
කජු නාඹර මොර ඉදිලා
මී අඹ සුවඳින් පිරිලා
කොහෝ නාද විසිරීලා

ඔන්චිලි චිලි චිල්ල මලේ
එරබදු පොපියයි දසතේ
බක්මහ සුන්දර සිහිනේ
අවුරුදු මිහිරයි මිතුරේ

උතුරු කොණේ දකුණු කොණේ
එක මවකගෙ දරු කැලසේ
සාමයෙ මල් දම් ගොතනා
අවුරුදු වේ සුබ සිහිනේ

♦ ***ධම්මි විජේසිංහ***
Toronto
Mississauga **Canada**